# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1572/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 14/12/2023<br>පැය 1110 |

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීම සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

**2023.12.13** වන දින සවස් කාලයේදී මුල්ලේරියාව පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 500 ක් සමග සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන්ගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී කොලොන්නාව ප්‍රදේශයේ යතුරු පැදියකින් පැමිණි පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කිරීමක් සම්බන්ධව අවශ්‍ය කරන සැකකරුවන් බවට අනාවරණය වී ඇති අතර, මෙම සිද්ධියට පැමිණි **යතුරු පැදිය, මන්නා පිහි 02ක්, සෙල්ලම් පිස්තෝලයක්, ජංගම දුරකථන 07 ක් සහ හෙල්මට් 02 ක් සහ ජැකට්** සොයා ගෙන ඇත. සැකකරුවන් වැඩිදුර විමර්ශන සඳහා බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 වයස් වල පසුවන කොලොන්නාව සහ දෙමටගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2023.12.13 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පැලියගොඩ පොලිස් වසමේ දරමඩුවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 මිලිග්‍රෑම් 100 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**